 ISSN 2362-0412

# සංවර්ධනය කරා ළඟා වීමේ දී ප්‍රාදේශීය නිලබල ධූරාවලියේ අදාළත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඒ. එච්. ඉන්දික සංජීව

*සමාජ විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

## සංක්ෂේපය

නූතන සංවර්ධනාභිමුඛ රාජ්‍ය ප්‍රතිපත්තීන් හමුවේ සංවර්ධන ක්‍රියාවලිය ගතානුගතික ස්වභාවයක් උසුලා ඇත. ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය උදෙසා රාජ්‍ය පරිපාලනමය කාර්යභාරය දැනට වත්මන් අගැයුම් මඟින් හඳුනාගත හැකිය. රාජ්‍ය අංශය අඛණ්ඩ ව ව්‍යාප්ත වී පැවතුණ ද එකී ආයතනයන්හි කාර්යසාධනය විමසිල්ලට ලක් විය යුත්තේ ප්‍රතිපත්ති සංස්කරණ ඔස්සේ විධිමත් රාමුවක ක්‍රියාත්මක වන ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහයෙන් සංවර්ධන ක්‍රියාවලියට හිමිවන්නා වූ පිටිවහල පිළිබඳ ජනතා ආකල්ප සැළකිල්ලට ලක්කිරීමෙන් අනතුරුව ය. ජාතික සංවර්ධනයක් ඇති වීමට නම් සියලු ප්‍රාදේශීය ඒකක සංවර්ධනය වී තිබිය යුතු ය. මෙම තත්ත්වය සාධනය කරගැන්ම උදෙසා ප්‍රාදේශීය පරිපාලන ක්‍රමය වැදගත් වේ. ප්‍රාදේශීය නිලබල ධූරාවලිය ලෙස හඳුනාගන්නේ මෙකී පරිපාලන ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන යාන්ත්‍රණය යි. එනම් ප්‍රාදේශීය ව පවත්නා නිලබල ධූරාවලිය යි. මෙකී නිලබල ක්‍රමයෙහි නිලධාරී ක්‍රියාකාරීත්වය මත ප්‍රාදේශීය සංවර්ධනයේ ස්වරූපය තීරණය වේ. එහෙයින් ප්‍රාදේශීය සංවර්ධන කාර්යයේ දී ප්‍රාදේශීය නිලබල ධූරාවලියේ කාර්යභාරය කවරාකාර වේ ද යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව ලෙස හඳුනා ගැනේ.

මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ මාතර දිස්ත්‍රික්කයේ මුලටියන මහ ලේකම් කොට්ඨාසයේ කැටපල කන්ද ග්‍රාම නිලධාරී වසම හා ගාල්ල දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දූවේගොඩ ග්‍රාම නිලධාරී වසම ආශ්‍රයෙනි. මෙම ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී හා කෘෂි පර්යේෂණ නිලධාරී යන තනතුරු පහළ මට්ටමේ නිලබල ධූරාවලිය ලෙස හඳුනාගැනෙන අතර මෙම ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් මොවුන්ගේ දායකත්වය සැසඳීම අපේක්ෂා කෙරේ. මේ සඳහා සරල සසම්භාවී ක්‍රමය ඔස්සේ පොකුරු නියදිය භාවිතයට ගනිමින් අවසානයේ එක්පිය පොකුරු නියදිය මේ සඳහා යොදා ගැනේ. ඒ යටතේ තෝරාගත් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ආශ්‍රයෙන් ප්‍රතිලාභී අදහස් විමසනු ලැබේ. අධ්‍යයනයේ දී නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නමාලා, නියමු තොරතුරු සපයන්නන් සහ ද්විතීයික මූලාශ්‍රය යන මෙවලම් භාවිත කෙරේ. මෙම අධ්‍යයනයට අනුව ප්‍රාදේශීය වශයෙන් ප්‍රජාව සහ නිලධාරීන් තුළ ද ඔවුනොවුන් අතර ද පවත්නා විෂමතා හඳුනාගත හැකිවිය. කැටපලකන්ද ප්‍රදේශය තුළ සංවර්ධන ව්‍යාපෘති සඳහා නිලධාරීන් මැදිහත්වීම මෙන් ම ප්‍රජාවගේ සහභාගීත්වය ද දුර්වලය. ප්‍රතිලාභීන් තෝරාගැනීමේ දී අක්‍රමිකතා ද පවතී. දූවේගොඩ ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණය අවම වුව ද ප්‍රජාවගේ සහ නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් ව්‍යාපෘතියේ නිමැවුම සාර්ථකව ඇත. එහෙත් එම ප්‍රදේශයේ නිලධාරීන් එකිනෙකා අතර අන්‍යොන්‍ය සබඳතා බිඳවැටීමෙන් සංවර්ධන ව්‍යාපෘති මඟහැරී ඇත. රාජ්‍ය අංශයේ මැදිහත්වීම ප්‍රමාණවත් නොවීම, නිලධාරීවාදය, අවිධිමත් සන්නිවේදනය මෙන්ම අන්තර්පුද්ගල ක්‍රියාවන්හි වර්ධනයක් සිදු නොවීම ප්‍රාදේශීය සංවර්ධනය අඩාළ වීමට හේතු සාධක ලෙස නිගමනය කළ හැකිය.

ප්‍රමුඛපද : සංවර්ධනය, නිලබල ක්‍රමය, ජනතා ආකල්ප, ප්‍රාදේශීය පරිපාලනය